# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
# දැන්වීමයි

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : නැව්ශිල්පී නිලධාරී - JLM

**අ) යෝග්‍යතාවය**

ලන්ඩන්හි රාජකීය නාවික නිර්මාණ ශිල්පී ආයතනයේ (Royal Institute For Navai Architects) ආශ්‍රිත සාමාජිකත්වය

**හෝ**

ලන්ඩන්හි නාවික ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය

**හෝ**

පිළිගනු ලැබූ වෘත්තීය ආයතනයකින් ලබාගත් ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (NDT) / උසස් ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (HNDT) / ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) / ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) / විවෘත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු ඩිප්ලෝමාව (ED-OUSL) / ඉංජිනේරු තාක්‍ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් (NDET) / නාවික ඉංජිනේරු හෝ ඒ හා සමාන ඩිප්ලෝමාව

**සමග**

**පළපුරුද්ද**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සමාන්තර තනතුරක වසර තුන (03) ක පළපුරුද්ද.

**සටහන**

i) බෝට්ටු හා නැව්හි ස්ථායීතාවය, දියත් මගට ගැනීම හා ආපසු දියත් කිරීම, ඒ සඳහා අවශ්‍ය නිර්මාණ සැලසුම් කිරීම හා සැකසීම, යාත්‍රාවන්හි ෆයිබර් (GRP) හා වඩු වැඩ පිළිබඳ මනා අවබෝධය හා පළපුරුද්ද තිබිය යුතුය.

ii) යහපත් කායික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා දෘෂ්‍ය හා ශ්‍රවණ හැකියාවකින් යුක්ත විය යුතුයි.

**ආ) වැටුප**

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : (JLM) |
| ආරම්භක වැටුප | : රු. 60,050/= |
| වාර්ෂික වැටුප් වර්ධකය | : රු. 1,150/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 134,000/= පමණ වේ

**වයස් සීමාව :** වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි)

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තිය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, මානව සම්පත් කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13. යන ලිපිනයට ලැබෙන සේ 2023.10.31 වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් **(slpahrex@slpa.lk)** එවිය යුතුයි. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම **www.slpa.lk** යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාල දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**

tamilguru.lk